# ජේ ආර් දවල් දුටු සිංගප්පූරු සිහිනය

එක්දහස් නවසියපනස් ගණන්වල මුල්භාගයේ සිංගප්පූරුවට ලංකාවක්වීමට අවශ්‍ය වූ බවත් හැත්තෑගණන්වල අගභාගයේ ලංකාවට සිංගප්පූරුවක් වීමට අවශ්‍ය වූ බවත් බොහෝ දෙනා දනිති. හැත්තෑහතේ ජේ ආර් ජයවර්ධන මහතා බලයට පත්වූයේ ලංකාව සිංගප්පූරුවක් කිරීමට පොරොන්දු වෙමිනි. එහෙත් අවුරුදු තිහකට පසුව ද ඇතැමුන්ගේ සිංගප්පූරු සිහිනය සැබෑ වී නැත. යළිට හේතුව කුමක් ද? අපි දියුණු වීමට තිබූ අවස්ථා රාශියක් නැතිකර ගත්තෙමු ද?

සිංගප්පූරුවට එදා ලංකාවක්වතමට අවශ්‍ය වූයෝ ඇයි? අද සිංගප්පූරුව යන නමින් හැඳින්වෙන රට එකල මලයාවේ කොටසක් විය. මලයාවේ බහුතරය මුස්ලිම් ජනයාගෙන් සමන්විත ය. අද මලයාසියාව නමින් හැඳින්වෙන රටෙහි බහුතරය මුස්ලිම් වුව ද, ඒ ප්‍රතිශතය සියයට පනහකට අඩු ය. එහෙත් එරට මුස්ලිම් ජනයා භූමිපුත්‍ර නමින් විශේෂ ජනකොටසක් ලෙස අන් අයට නැති වරප්‍රසාද භුක්තිවිඳිති. අද ද මලයාසියාවේ බහුතර මුස්ලිම් ජනයා ප්‍රතිශතයක් ලෙස සියයට පනහකට අඩුනම් එදා සිංගප්පූරුව ද මලයාවේ කොටසක් ව පැවති සමයේ ඒ ප්‍රතිශතය එයට අඩුවිය යුතු ය.

එසේ වුවත් එදා ද මලයාවේ සුවිශේෂ ජනවර්ගය මුස්ලිම් විය. එසේ වූයේ ඉස්ලාම් ආගමිකයන් එකල සිට අද දක්වා ම සියයට පනහකට අඩුවුවත් ඔවුන්ට වැඩි දේශපාලම බලයක් තිබීම ය. මේ දේශපාලන බලය හේතුවෙන් එදා මලයාවත් අද මලයාසියාවත් මුස්ලිම් රාජ්‍ය ලෙස හැඳින්වීමේ කිසිදු අපහසුතාවක් නැත. එදා මෙන් ම අද ද එරට ආර්ථික බලය ඇත්තේ චීන ජනවර්ගයට ය. ඔවුහු ආගමින් බෞද්ධ වෙති.

සිංගප්පූරුව නමින් රටක් ඇතිවීමේ දී චීන ජනවර්ගයාගේ ප්‍රශ්නය ද බලපා ඇත. ඒ කෙසේවෙතත් මේ වෙන්වීමට බ්‍රිතාන්‍යයන්ගේ අනුබලය නොලැබී යැයි කිව නො හැකි ය. එදා අඩුම තරමින් ඇතැම් චීන ජනවර්ගිකයනට ලංකාව අනුගමනය කළ යුතු රටක් ලෙස පෙනුනේ ඇයි? සිංගප්පූරුව නමින් රටක් ඇතිවීමෙන් පසු එරට සංවර්ධනය කිරීමෙහි දී ලංකාව ආදර්ශයට ගතයුතු යැයි ඇතැමුන් කල්පනාකරන්නට ඇත්තේ ඇයි? එකල ලඅකාව මිහිබට සුරපුරක් වී ද?

අපට නිදහස ලැබීමෙන් පසුව හා ඒ ආසන්නයේ පැවති කොරියන් යුද්ධය හේතුවෙන් මෙරට ආර්ථිකය එකල ශක්තිමත් වී යැයි කියැවෙයි. ඒ එසේ වන්නට ඇත. එහෙත් මෙරට සාමාන්‍ය ජනතාවගේ ජීවිත එදා යහපත් වී ද? අප මෙහි දී අමතක නොකළ යුතු කරුණක් නම් අපේ අවධානයට භසුවන යුගයේ එක් වසරක දී, එකදහස් නවසිය පනස්තුනේ වසරේ දී මෙරට හර්තාලයක් පැවති බව ය.

එමෙන් ම සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය දිවයින පුරාගොස් සාක්ෂි සටහන් කරගනිමින් මෙරට බෞද්ධ ජනතාවට සාධාරණයක් ඉටු වී ඇත් ද යන්න ගැන ප්‍රසිද්ධියේ සොයාබැලීමට ඉදිරිපත් වූයේ ද පනස්තුනෙන් පසුව බව ය. එකල මෙරට රාජ්‍ය භාෂාව ඉංගිරිසි විය. නිදහස් අධ්‍යාපනය මෙකල මෙන් පැතිරීගොස් නො තිබුණි. සමස්තයක් ලෙස ගත්කල සාමාන්‍ය ජනයාට හොඳ යැයි කිවහැකි ජීවන රටාවක් නො වී ය.

එදා මෙරට වෘත්තීන්හි, විශ්වවිද්‍යාලවල, සිංහලයන්ගේ අනුපාතය ජනගහනයෙන් සිංහලයන්ගේ අනුපාතයට බෙහෙවින් අඩුවිය. දෙමළ ජනයා සමස්තයක් ලෙස ගත්කල සිංහලයන්ට වඩා වරප්‍රසාද ලත් ජනවර්ගයක් විය. බ්‍රිතාන්‍යයෝ සිංහලයන් නිකම් ම නිකම් මහජාතියක් (මහාජනවර්ගයක්) බවට පත්කර තිබූහ. එසේ වුවත් එදා සිංගප්පූරුවට ලංකාව අනුගමනයකිරීමට අවශ්‍ය විය.

එලෙස ලංකාව අනුගමනයකිරීමට අවශ්‍ය වූයේ සිංගප්පූරුවේ නායකයනට බව පැහැදිලි ය. අවුරුදු තිහකට පෙර සිංගප්පූරුව අනුගමනයකිරීමට අවශ්‍ය වූයේ ද නායකයන් පිරිසකට ය. ලංකාවේ සාමාන්‍ය ජනයාට සිංගප්පූරුවක්

© Prof. Nalin De Silva

අනුගමනයකිරීමේ අවශ්‍යතාවක් එදා තිබිණි යැයි සිතිය නො හැකි ය. අද යම් ප්‍රමාණයකට හෝ මේ අදහස සාමාන්‍ය ජනයා අතරට ගොස් ඇත්නම් ඒ ආකෘතික පාසල් අධ්‍යාපනය හා අනාකෘතික ජනමාධ්‍ය අධ්‍යාපනය ඔස්සේ ය.

එදා නායකයන් පුහුණුකරනු ලැබුයේ ද අධ්‍යාපනය විසිනි. මේ අධ්‍යාපනය ඔස්සේ එද මෙන් ම ද අද ද සංවර්ධනය පිළිබඳ යම්කිසි ආකෘතියක් අධ්‍යාපනය ලබන්නන්ගේ සිත්වලට ලැබෙයි. එදා නායකයන්ට ද අද ඊට වැඩි පිරිසකට ද ඇත්තේ සංවර්ධනය පිළිබඳ ව බටහිර ආකෘතියයි. ඒ ආකෘතිය ගැන කතානොකර නිරපේක්ෂව සංවර්ධනයක් ගැන සඳහන්කිරීම බටහිර අධ්‍යාපනයෙන් කෙරෙන නොමග යැවීමකි. එදා ලංකාවේ නායකයෝ බටහිරයන් විසින් පුහුණුකරනු ලැබුවෝ වූහ. එපමණක් නොව ඔවුහු බටහිරයන් විසින් අපට දෙනු ලැබූ නායකයෝ වූහ. ඔවුහු කිසි දිනෙක සාමාන්‍ය ජනයාගේ නායකයෝ නො වූහ. බටහිරයන් විසින් පුහුණු කෙරී නායකත්වයට පත්කරනු ලැබූ ඔවුහු බටහිරයන් කියන කරන දෙය ඒ අයුරින් ම කළහ, ඒ සඳහා අද දිය හැකි හොඳම උදාහරණය රනිල් වික්‍රමසිංහ මහතා වෙයි. ඒ මහතා මෙරට ජනයා විසින් පත්කරගනු ලැබූ නායකයකු නොවන බව අද එ ජා පක්ෂයේ සිදුවන ක්‍රියාවලියෙන් ද පැහැදිලි වෙයි.

නිදහස ලැබුණු පසු මෙරට වැඩිවශයෙන් ක්‍රියාත්මක වූයේ බටහිරයන්ට අවශ්‍ය දේ ය. මෙත්තානන්ද මහතා වැනි නායකයෝ එදා කතෝලික ආක්‍රමණයක් ගැන කතාකෙළේ කට කහනාවට නොවෙයි. පනස්හය වන විටත් සිංහලයන්ට, විශේෂයෙන් ම සිංහල බෞද්ධයනට මෙරට ඔවුන්ට හිමිවිය යුතු තැන නොලැබී තිබුණි. සිංහලයන්ට මේ තත්වය වෙනස්කිරීමේ අවශ්‍යතාව විය. ඔවුන්ට එදා අවිඥානිකව හෝ බටහිර සංවර්ධන ආකෘතිය ද වෙනස්කිරීමේ අවශ්‍යතාව තිබෙන්නට ඇත.

සිංහලයන්ට, විශේෂයෙන් ම සිංහල බෞද්ධයනට ඒ තත්වය වෙනස්කිරීමට අවශ්‍ය වුව ද, නායකයනට එවැනි අවශ්‍යතාවක් නො වී ය. සිංහලයෝ එවිට බන්ඩාරනායක මහතා පිහිටුවාගත් ශ්‍රී ල නි පක්ෂය ලවා තම අවශ්‍යතාව ඉටුකරගැනිමට උත්සාහ කළහ. එහෙත් සිංගප්පූරුවට අවශ්‍ය වූයේ සිංහලයන්ට එපා වී සිබු ආර්ථිකය, සංවර්ධන ආකෘතිය හා සමාජ රටවා ය. ඒ රටාවේ සිංහලත්වයට හිමිවිය යුතුව තිබූ තැන නොතිබුණි. දෙමළ, මුස්ලිම් ජනවර්ගවලට තම ජනගහන අනුපාතය, තම ඉතිහාසය, තමන් විසින් සමාජයට එකතුකරන ලද සංස්කෘතික දායාද ආදිය ඉක්මවා යන අයුරින් විවිධ ක්ෂෙත්‍රවල බලය තිබුණි.

අද සිංගප්පූරුව නමින් ඇති රටෙහි එදා ජවත් වූ චීන ජනවර්ගයට එදා ලංකාව ප්‍රියමනාප වී නම් එහි පුදුමයට කරුණක් නැත. ඔවුන්ට අවශ්‍ය අන්දමට ම මෙරට සිංහලත්වයට (මලයාවෙහි මුස්ලිමුනට අනුරූප ව) හිමි තැන නො ලැබිණි. මෙහි මුල් තැන තිබුණේ අසිංහලයනට ය. මෙරට නායකයෝ බටහිර වෙළෙඳ ආකෘතිය අනුගමනයකිරීමට කැප වී සිටියහ. ඔවුන් සංවර්ධන ආකෘතිය ලෙස දුටුවේ බටහිර සංවර්ධන ආකෘතිය ය. එහෙත් මලයාවෙහි මුස්ලිමුන්ට හිමිතැන අහිමිකිරීමට එහි චීන ජනවර්ගයට නොහැකි විය. මලයාවට සාපේක්ෂව බැලූකල මුස්ලිමුන්ට ලංකාව එකල හොඳ ආකෘතියක් විය.

අද සියළු උගතුන් පාහේ එකතුව පනස්හයෙන් පසුව ලංකාවට සංවර්ධනයවීමට නොහැකි වී යැයි මහහඬින් කියති. ජේ ආර් ජයවර්ධන හැත්තෑහතේ දී ඊනියා විවෘත ආර්ථිකයක් හා ඒ සමග සමාජයීය ආකල්පවල වෙනසක් ඇතිකිරීමට උත්සාහ කෙළේ පනස්හය ආපසු හරවා "සංවර්ධනයවීමට" ය. එහෙත් පසුගිය අවුරුදු තිහක කාලයක් මුළුල්ලේ ඇති වූ සංවර්ධනය කුමක් ද? සිංගප්පූරුවට එදා ලංකාව අනුගමනයකර සංවර්ධනයවීමට අවුරුදු විස්සක් ගත නො වී ය. එහෙත් සිංගප්පූරුව අනුගමනයකර අවුරුදු තිහකින් හෝ "සංවර්ධනයවීමට" ලංකාවට නොහැකි වී ඇත. එයට හේතුව කුමක් ද? සිංහලයන්ගේ කම්මැලිකම ද? සිංහලයන්ට වැඩ බැරිකම ද? නැත්නම් දේශපාලනඥයන්ගේ දුර්වලකම ද? අනෙක් රටවල දේශපාලනඥයන් අපේ දේශපාලනඥයන්ට වඩා අවංක ද? නැත්නම් ධනපති ක්‍රමයට ලංකාව වැනි රටක් "සංවර්ධනයකිරීමට" නොහැකිකම ද? අනෙක් ආසියාතික රටවල ධනපති ක්‍රමයට ඒ රටවල් සංවර්ධනයකිරීමට හැකි වූයේ ඇයි? ලංකාවට වැරදුනේ කොතැන ද? ලංකාවට වැරදී තිබේ යැයි කීම ම වැරදි ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva